**ශීර්ෂය - 284 වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

**----------------------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**---------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූනි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට  වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනූරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) තැන්පත් ගිණුම් අංක 6000-0-0-006-0-020-0 යටතේ ලැබී ඇති රු.851,604,272 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ තැන්පත් ලැබීම් යටතේ දක්වා නොතිබුණි. | වනසත්ව සංරක්ෂණ අරමුදල මෙම දෙපාර්තමේන්තුව සඳහා විශේෂිත අරමුදලක් බැවින් එහි ලැබීම් තැන්පත් ලැබීම් යටතේ ඇතුලත් නොකර පැහැදිළිව වෙනම පෙන්වා ඇත. | භාණ්ඩාගාර සටහන් අනුව තැන්පත් ගිණුම් අංක 6000-0-0-006-0-020-0 යටතේ දක්වා ඇති බැවින් තැන්පත් ලැබීම් වශයෙන් දැක්විය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | භාණ්ඩාගාර සටහන් අනුව රු.39,534,166 ක් වූ අත්තිකාරම් ලැබීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගලපා තිබුණේ රු.36,205,110 ක් වශයෙනි. ඒ අනුව රු.3,329,056 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අත්තිකාරම් ලැබීම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය සඳහා ඇතුලත් කල යුත්තේ වෙනත් වැය ශීර්ෂවලින් කරන ලද ලැබීම් අඩු කිරීමෙන් පසුව බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වටිනාකම් භාණ්ඩාගාර සටහන් සමඟ සසඳා නිවැරදි අගය දැක්වීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | දෙපාර්තමේන්තු පොත් අනුව වෙනත් ආදායම් සංකේත 04 ක් යටතේ රු.68,184,817ක් අයකර ගෙන තිබුණද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් ලෙස රු.958,895,389 ක් දක්වා තිබුණි. | වෙනත් ආදායම් සංකේත 04 ක් යටතේ රු.107,291,117 ක් හා වනසත්ව සංරක්ෂණ අරමුදලේ ලැබීම් ලෙස රු.851,604,272 ක් වශයෙන් රු.958,895,389 ක් වෙනත් ලැබීම් ලෙස දක්වා ඇත. | විධිවිධාන ප්‍රකාරව වෙනත් ආදායම් සංකේතවලට අදාළ ලැබීම්වල නිවැරදි අගය දැක්වීමට කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | භාණ්ඩාගාර සටහන් අනුව රු.55,690,601 ක් වූ අත්තිකාරම් ගෙවීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගලපා තිබුණේ රු.55,104,615 ක් වශයෙනි. ඒ අනුව රු.585,986 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වෙනත් වැය ශීර්ෂවලින් කරන ලද හර කිරීම් අඩුකර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දැක්විය යුතු බැවින් රු.55,104,615 නිවැරදි බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී එහි ඇතුළත් සංඛ්‍යා භාණ්ඩාගාර සටහන් සමඟ සසඳා නිවැරදි අගය දැක්වීමට කටයුතු කළ යුතු වේ. |

**1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| | --------------------- | ---------------------------------- | ----------- |
| (අ) | දෙපාර්තමේන්තු පොත් අනුව පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් රු.1,356,844,570 ක් වූ අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගලපා තිබුණේ රු.1,286,728,503 කි. ඒ අනුව රු.70,116,067 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් රු.1,286,728,503 නිවැරදි බව පෙන්වා දෙන අතර එය ACA 2-II හි පැහැදිළිව දක්වා ඇති බව දන්වමි. | විධිවිධාන ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයට නිවැරදිව අගය දැක්වීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙපාර්තමේන්තු පොත් අනුව සහනාධාර හා මාරු කිරීම් වැය විෂයන් 03 ට අදාළව රු.37,950,008 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව රු.41,367,997 ක් විය. ඒ අනුව රු.3,417,989 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 284-1-1-11-1205(11) වැය විෂය 2020 අයවැය ඇස්තමේන්තුවෙන් වෙනත් පුනරාවර්තන වියදම් ලෙස වර්ග කර ඇති බැවින් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල සහනාධාර හා මාරු කිරීම් යටතේ පෙන්වා ඇත. | -එම- |
| (ඇ) | දෙපාර්තමේන්තු පොත් අනුව වෙනත් ආදායම් සංකේත 04 ක් යටතේ රු.68,184,817 ක් අයකර ගෙන තිබුණද මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව රු.107,291,117 ක් විය. ඒ අනුව රු.26,609,847 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ආදායම් නොවන ලැබීම් රු.107,291,116 නිවැරදි බව දන්වමි. | -එම- |
| (ඈ) | දෙපාර්තමේන්තු පොත් අනුව වෙනත් දෙපාර්තමේන්තු වෙනුවෙන් දරන ලද වියදම රු.5,187,802 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව රු.5,895,117 ක් විය. ඒ අනුව රු.707,315 ක් වැඩියෙන් දක්වා තිබුණි. | එම වෙනස මාරු පත්‍ර මගින් කරන ලද ගිණුම් තැබීමක් බවත් ඒ අනුව රු.5,895,117 නිවැරදි බවත් දන්වමි. | -එම- |
| (ඉ) | දෙපාර්තමේන්තු පොත් අනුව භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් රු.73,212,742 ක් වූ අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව එය රු.139,910,821 ක් වූයෙන් රු.66,698,079 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ACA 2(II) හි 5 වන තීරයෙහි පරිදි මූලධන වියදම් වල එකතුව මෙහි දක්වා ඇති බව දන්වමි. | -එම- |
| (ඊ) | දෙපාර්තමේන්තු පොත් අනුව රු.1,736,631,619 ක් වූ තැන්පත් ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව රු.1,775,737,909 ක් විය. ඒ අනුව රු.39,106,290 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මාරු පත්‍රවලින් ගිණුම්ගත කිරීම් නොමැතිව විගණනය විසින් පෙන්වා දී ඇති බව දන්වමි. | -එම- |

| | | | |
|---|---|---|---|
| (උ) | දෙපාර්තමේන්තු පොත් අනුව අත්තිකාරම් ආපසු අයකර ගැනීම් රු.38,754,738 ක් වූ අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව රු.39,463,553 ක් විය. ඒ අනුව රු.708,815 ක් වැඩියෙන් දක්වා තිබුණි. | එකී වෙනස ලෙස විගණනය විසින් පෙන්වා ඇත්තේ මාරු පත්‍රවලින් ගිණුම්ගත කිරීම් නොමැතිව බව දන්වමි. | -එම- |

**1.6.3 අක් මුදල් ගැලපුම් ගිණුම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| භාණ්ඩාගාර සටහන් හා දෙපාර්තමේන්තු ගිණුම් අනුව වෙනස්කම් ගැළපීමේදී තැන්පතු ගෙවීම් රු.39,106,290 ක් සටහන්කර නොතිබූ අතර, අත්තිකාරම් ලැබීම් රු.364,137 ක් අඩුවෙන්ද, වැය ශීර්ෂ 05 කට අදාළ රු.707,315 ක් වැඩියෙන්ද, අත්තිකාරම් ගෙවීම් රු.3,086,237 ක් වැඩියෙන්ද දක්වා තිබුණි. | අක්මුදල් ගිණුමේ දක්වා ඇති ශේෂය නිවැරදි බව දන්වමි. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය පිළියෙල කිරීමේදී භාණ්ඩාගාර සටහන් අනුව වටිනාකම් ගත යුතු අතර දෙපාර්තමේන්තු පොත් අනුව වෙනසක් පවතින්නේ නම් එම වෙනස අග්‍රිම ගැලපුම් ගිණුමට ගැලපිය යුතු වේ. |

1.6.4 **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ ලේඛනයක් ඉදිරියේදී පවත්වා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි 454(2) හි සඳහන් පරිදි රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගත යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 50 ට අනුකූලව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂය සඳහා පිළියෙල කළ ඇස්තමේන්තුවේ වැය විෂයන් 07 ක සියයට 23 සිට සියයට 75 දක්වා පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණය විය. | ඇස්තමේන්තුවේ සමහර වැය විෂයන්ගේ ඉතිරි වීම් දෙපාර්තමේන්තු පාලනයෙන් බැහැර ක්‍රියා (කොවිඩ් 19 වසංගතය නිසා ඇති වූ තත්වයන් වැනි) හේතුවෙන් සිදු වූ බව දන්වමි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිසි සැලැස්මකින් හා කළමණාකාරීත්වයකින් යුතුව ඇස්තමේන්තු සකස් කිරීමට පියවර ගත යුතු වේ. |

## 2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි ඉදිරියේදී මූල්‍ය පාලනය පිළිබඳ සමාලෝචනයක් සිදුකර වාර්තා කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| (i) XLVIII පරිච්ඡේදයේ 28.3 වගන්තිය | බකමූණ වනජීවී කාර්යාලයේ සහ කුමාර ඇල්ල බීට්ටුවේ නිලධාරීන් 02 දෙනෙකු අල්ලස් ගැනීම සම්බන්ධ වරදකරුවන් බවට අධිකරණය විසින් නියම කළද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම නිලධාරීන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | දඩුවම් නියම වූ නිලධාරීන් විසින් නඩු තීන්දුවට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කර තිබේද යන්න අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවෙන් විමසීම් කර ඇත. මේ සම්බන්ධයෙන් සිහිකැඳවීමක් යොමුකිරීමට කටයුතු කරන බවත්, එකී තොරතුරු ලද පසු ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බවත් දන්වමි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) XLVIII පරිච්ඡේදයේ 1.2 ඡේදය | විනය ක්‍රියාමාර්ග 20 ක් සම්බන්ධයෙන් විමර්ශනය සඳහා කමිටු පත්කර වර්ෂ දෙකකට වැඩි කාලයක් ගත වුවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විමර්ශන අවසන් කර නොතිබුණි. | මීට අදාලව සියළුම විමර්ෂන නිලධාරීන්ට සිහිකැඳවීම් යොමුකර ඇති බවත්, නැවත සිහිකැඳවීම් යොමුකර අදාල වාර්තා ලබා ගැනීමට කටයුතු කරන බවත් දන්වමි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 101(3) | දෙපාර්තමේන්තුවේ විවිධ අංශවල බඩු ලේඛන පොත් නඩත්තු කරනු ලබන නිලධාරීන් තමා භාරයේ පවතින භාණ්ඩ ශේෂය හා බඩු ලේඛන පොත් ශේෂය විශ්ලේෂණය කරමින් ඌණතා හා අතිරික්ත හඳුනාගැනීමට කටයුතු | නිකුත් කිරීමේ නියෝග හා බඩු වට්ටෝරු පොත් පරීක්ෂා කර ඇතුළත් නොවූ භාණ්ඩ හා ඌනතා ඇති භාණ්ඩ පිළිබඳව භෞතිකව සොයා බැලීමට කටයුතු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | කර නොතිබුණි. මේ හේතුවෙන් ගබඩාව විසින් විවිධ අංශ වෙත නිකුත් කර තිබූ භාණ්ඩවලින් රු.3,019,132 ක් පමණ වටිනා අයිතම 46 ක ඌණතාවයක් පවතින බව විගණනය විසින් සිදුකළ භෞතික තොග සත්‍යාපනයේදී නිරීක්ෂණය විය. | | |
| (ii) | මුදල් රෙගුලාසි 571 | තැන්පත් කල දින සිට වර්ෂ දෙකක් ඉක්ම වූ රු.3,937,613 ක් වූ පොදු තැන්පතු ගිණුමේ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම තැන්පතුවලට අදාලව ගෙවීම් සඳහා අවශ්‍ය වාර්තාවල ඇති අඩුපාඩු නිසා රුඳවුම් මුදල් ගෙවීම ප්‍රමාද වී ඇති බව දන්වමි. | -එම- |
| (iii) | මුදල් රෙගුලාසි 751(1) | 2016 ජනවාරි 01 දින සිට 2020 දෙසැම්බර් 31 දක්වා කාලය තුල ප්‍රධාන ගබඩාවෙන් නිකුත් කරනු ලැබූ රු.10,332,963 ක වටිනාකමින් යුත් භාණ්ඩ අයිතම 133 ක් සහ රු.3,597,685 ක් වටිනා රේඩියෝ සන්නිවේදන උපකරණ 138 ක් එක් එක් අංශවලට අදාළ බඩු ලේඛන පොත්වල ඇතුළත් කර නොතිබුණි. | මේ වන විට රු.9,113,642 ක් වටිනා භාණ්ඩ සොයා ගැනීමට හැකිවූ බවත් ඉතිරි භාණ්ඩ පිළිබඳව තවදුරටත් පරීක්ෂා කරගෙන යයි. යම් නිලධාරියෙකු වංචනිකව කටයුතු කර ඇති බව අනාවරණය වුවහොත් විනයානුකූලව කටයුතු කරන බව දන්වමි. | -එම- |
| (iv) | මුදල් රෙගුලාසි 756 | වර්ෂය අවසානයේ භාණ්ඩ සමීක්ෂණයක් සිදුකල යුතු වුවත් සමුද්‍ර අංශයෙහි භාණ්ඩ සමීක්ෂණය සහ සැලසුම් අංශයේ ESCAMP ව්‍යාපෘතියට අදාල උපකරණ සඳහා භාණ්ඩ සමීක්ෂණය 2017 වර්ෂයෙන් පසුව සිදු කර නොතිබුණි. | සමුද්‍ර සංරක්ෂණ අංශය සඳහා වෙනම භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොමැති අතර, මින් ඉදිරියට එම අංශයේ සමීක්ෂණයද සිදු කිරීමට කටයුතු කරන බව දන්වමි. | -එම- |
| (v) | මුදල් රෙගුලාසි 880 | රජයේ බඩු භාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටි නිලධාරීන් ඇප තැබීම සිදුකල යුතු වුවද එලෙස කටයුතු කර නොතිබුණි. | ඇප තබා නොමැති නිලධාරීන් සඳහා ඇප තැන්පත් කිරීමට කටයුතු කර දැනට පවත්වාගෙන යන ඇප තැන්පත් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව දන්වමි. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2014 මාර්තු 14 දිනැති හා අංක 01/2014 දරන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 1.2 ඡේදය | ප්‍රාග්ධන ස්වභාවයේ භාණ්ඩ ගබඩාවෙන් නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මුදල්ගේ අනුමැතිය ලබා ගත යුතු වුවද ඊට පටහැනිව නිකුත් කිරීම් නියෝග 180 කින් භාණ්ඩ අයිතම 248 ක් අධ්‍යක්ෂ මුදල්ගේ අනුමැතියකින් තොරව නිකුත් කර තිබුණි. | මින් ඉදිරියට අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ (මුදල්), නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) සහ සහකාර අධ්‍යක්ෂ (මුදල්) ගේ අනුමැතිය සහිතව භාණ්ඩ නිකුත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

---------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද ප්‍රකාරව රජයට අය විය යුතු මුදල් අය කර ගත යුතු ආකාරය දක්වා ඇතත් මිය ගිය, විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා වැඩ තහනම් කල නිලධාරීන් 24 දෙනෙකුගෙන් අය විය යුතු වර්ෂ 05 ඉක්ම වූ රු.973,648 ක ණය ශේෂය අයකර ගැනීමට දෙපාර්තමේනතුව අපොහොසත් වී තිබුණි. | ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධව ඉදිරි කටයුතු තවදුරටත් සිදුකරමින් පවතින බව දන්වමි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

--------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව ඉලක්ක ගත කාර්යයන් 27 ක් සඳහා රු.23,987,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ නමුත් ඒවා ක්‍රියාත්මක කර නොතිබුණි. | Covid වසංගතය හේතුවෙන් වනජීවී රක්ෂිත තුළට බාහිර පුද්ගලයන්ට ඇතුල්වීමට අවසර නොදීම හේතුවෙන් මෙම කාර්යයන් ඉටු කිරීමට නොහැකි වූ බව දන්වමි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක ගත කාර්යයන් සම්පූර්ණ කළ යුතු වේ. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 22 ක භෞතික ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි. | Covid වසංගතය හේතුවෙන් මෙම කාර්යයන් ඉටු කිරීමට නොහැකි වූ බව දන්වමි. | ක්‍රියාකාරි සැලැස්මට අනුව ඉලක්ක ගත කාර්යයන් සම්පූර්ණ කළ යුතු වේ. |

## 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2016 වර්ෂයේදී යාල ජාතික උද්‍යානය සඳහා Ticket Vending machine 02 ක්, Mini PC 03 ක් හා 19" Mini PC Tray 2U 01 ක් රු.2,205,526 කට මිලදී ගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒවා භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | Mini PC 03 හා ඉලෙක්ට්‍රොනික් උපාංග හා යන්ත්‍ර යාවත්කාලීනව පවත්වාගෙන යාමට ක්‍රියා කරන බව දන්වමි. | වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතු වේ. |
| (ආ) විදේශාධාර ව්‍යාපෘති 02 කට අදාළ ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දුන් වත්කම් සටහන් කරන ලද බඩු ලේඛන පොත් අස්ථානගත වී තිබුණි. මේ හේතුවෙන් ණය ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවලින් ලැබෙන වත්කම්වල ආරක්ෂාව සම්බන්ධ අභ්‍යන්තර පාලනය දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | මෙම ව්‍යාපෘතිය අවසානයේ ව්‍යාපෘතිය මඟින් දෙපාර්තමේන්තුවට ලබා දී තිබූ භාණ්ඩ ශේෂයන් ප්‍රධාන කාර්යාලීය ගබඩාවේ තොග ලේඛනවලට ඇතුලත් කර තිබුණි. මේ වන විට අදාළ ලේඛන සොයා ගැනීමට නොහැකි බවත් ඒ පිළිබඳ සුදුසු ක්‍රියා මාර්ගයක් ගෙන ඒ පිළිබඳව වාර්තා කරමි. | ව්‍යාපෘතිවලින් ලැබෙන වත්කම්වල ආරක්ෂාව සම්බන්ධ අභ්‍යන්තර පාලනය විධිමත් කළ යුතු වේ. |

## 3.4 පාඩු හා හානි

--------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ---------------------- | ----------------------------------- | ------------- |
| නැගෙනහිර කලාපයේ ඉදිකරන ලද විදුලි වැටවල් 07 ක රු.1,546,000 ක් වූ විදුලි උපකරණ සොරා ගෙන තිබුණද මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශන වාර්තාවක් සැප්තැම්බර් මාසය අවසන් වීමට පෙර ලබා දීමට කටයුතු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ---------------------- | ----------------------------------- | ------------ |
| (අ) මුතුරාජවෙල පරිසර පද්ධතියේ හෙක්ටයාර 1285 ක බිම් කොටසක් 1996 අංක 947/13 දරන ගැසට් පත්‍රය මඟින් අභයභූමියක් ලෙස ගැසට් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම අභයභූමියේ මායිම් ලකුණු කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත මුදල් ගෙවා අභය භූමියේ මායිම් සියල්ල නැවත විධිමත් කරන ලද බවත් ඒ අනුව ඉදිරියේදී මෙම කාර්යය නිසි පරිදි සිදුවන බව සඳහන් කරමි. | අභයභූමියේ මායිම් නිශ්චිතව ලකුණු කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) 2019 සහ 2020 වර්ෂ තුළදී විදුලි වැට ඉදිකිරීම හා නඩත්තුව සඳහා දරන ලද වියදම පිළිවෙලින් රු.197,983,635 සහ රු.257,521,334 ක් වූ අතර 2020 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණ විදුලි වැටෙහි දිග ප්‍රමාණය කිලෝමීටර් 4,756 ක් විය. එසේ වුවද පසුගිය වර්ෂ 05 ක් | මෙයට හේතුව වන්නේ වනඅලි මිනිස් ගැටුම් පවතින ප්‍රදේශවල ආර්ථික ක්‍රියාකාරිත්වය සීඝ්‍රයෙන් වර්ධනය වීම, එය හේතුකොට ගෙන වන අලීන්ගේ සංචරණ මං පෙත්වලට බාධා ඇති වීම හා රක්ෂිතවලින් බැහැරව වන ගැටුම් මැඩලීම සඳහා යොදා ගන්නා උපක්‍රමයන් නිසි | අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා විධිමත් උපක්‍රමයන් හඳුන්වා දීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | තුළ සිදු වූ අලි මරණ, මිනිස් මරණ හා දේපළ හානි සැලකීමේදී විදුලි වැට ඉදිකළ ද අලි මිනිස් ගැටුම අවම වීමක් නිරීක්ෂණය නොවීය. | ප්‍රමිතියෙන් යුතුව ක්‍රියාත්මක කිරීමට බාධා ඇති වීම යනාදි කරුණු හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වී ඇත. | |
| (ඇ) | කවුඩුල්ල ජාතික උද්‍යානයේ සිදු වූ ප්‍රවේශ පත්‍ර අක්‍රමිකතාවය සහ හම්බන්තොට අඩවියේ සිදුකරන ලද හදිසි වැටලීමකදී අත් අඩංගුවට ගත් සැකකරුවකු රැඳවුම් භාරයේ සිටියදී පලායාම යන සිද්ධීන් දෙකට අදාල මූලික විමර්ශන වාර්තාවල සඳහන් නිර්දේශ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | මෙම සිද්ධිය සම්බන්ධයෙන් සිදුකළ මූලික විමර්ශනයේ නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙස අදාළ නිලධාරින් වෙත දැනුම් දී ඇති බව දන්වමි. | මූලික විමර්ශන වාර්තාවල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු වේ. |
| (ඈ) | 2017 සැප්තැම්බර් 04 දින සිට 2017 සැප්තැම්බර් 07 දින දක්වා ගැල්වේස්ලැන්ඩ් ජාතික උද්‍යානයේ ආදායම් ගාස්තු බැංකු ගත නොකර සාවද්‍ය පරිහරණය කර තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදුකරන ලද මූලික විමර්ශනයේ අතුරු වාර්තාව 2019 අප්‍රේල් 05 දින මූලික විමර්ශන නිලධාරි විසින් ඉදිරිපත් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | මෙම සිද්ධියට අදාළ පූර්ණ වාර්තාව ලබාදෙන ලෙස මූලික විමර්ශන නිලධාරී වෙත සිහිකැඳවීම් ලිපි මඟින් දැනුම් දී ඇත. නැවතත් මෙම විමර්ශන විමසුමේ සඳහන් කරුණු ද සිහිපත් කරමින් සිහිකැඳවීමේ ලිපියක් යොමු කිරීමට කටයුතු කරන බව දන්වමි. | කඩිනමින් අවසන් වාර්තාව නිකුත් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | 2012 ජනවාරි 06 දිනැති හා අංක අමප/11/2299/549/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අලින්ගෙන් සිදුවන හානි අවම කිරීම සඳහා ඉදි කරනු ලබන විදුලි වැට නඩත්තු කිරීමට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ භටයන් යොදා ගෙන තිබුණි. මෙම සේවාව ඵලදායීව ලබා ගැනීම සඳහාත් විදුලි වැට නඩත්තුව සඳහා දරන වියදම් විධිමත් පරිදි | 2012 වර්ෂයේ අවබෝධතා ගිවිසුමක් සකස් කර තිබූ අතර එයට අත්සන් තැබීම සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් එකගතාවය පලනොවුණි. නමුත් වනජීවී දෙපාර්තමේන්තුව හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව එවැනි ගිවිසුමකට එළඹීමට මූලික තොරතුරු හුවමාරු කර ගෙන ඇති බවත් ඒ අනුව නුදුරේම | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව අතර ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතු වේ. |

| | |
|---|---|
| කළමනාකරණය කර ගැනීම සඳහාත්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව අතර නිශ්චිතව එකඟ වූ ගිවිසුමකට එළඹිය යුතු වුවද එලෙස කටයුතු කර නොතිබුණි. | ගිවිසුමකට එළඹීමට කටයුතු කරන බව දන්වමි. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 11 ක් ඇතුලුව දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 367 ක් විය. | මේ වන විට පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට ක්‍රියා මාර්ග ගෙන ඇති බව දන්වමි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. |